# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

සමාජීයවිද්‍යා පීඨය

## සමාජ විද්‍යාව

### සමාජ පර්යේෂණ ක්‍රම SOCI - E 3025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. නිර්වචන කිහිපයක් ඔස්සේ සමාජ පර්යේෂණ යනු මොනවාදැයි හඳුන්වා සමාජ පර්යේෂණවල විද්‍යාත්මක පදනම පැහැදිලි කරන්න.

02. ප්‍රධාන පර්යේෂණ වර්ග මොනවාදැයි වර්ගකර ගුණාත්මක පර්යේෂණ හා ප්‍රමාණාත්මක පර්යේෂණවල දැකිය හැකි ප්‍රධාන ගුණාංග පැහැදිලි කරන්න.

03. ඔබ පර්යේෂණ යෝජනාවක ඇති මූලික පියවර පැහැදිලි කරන්නේ කෙසේද? අවශ්‍ය උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

04. සමාජ පර්යේෂණ සඳහා නියැදිය ලබාගැනීමේදී අවධානය යොමුකළ යුතු කරුණු පෙන්වා ප්‍රධාන නියැදි වර්ග සැකෙවින් විස්තර කරන්න.

05. සමාජ පර්යේෂණවල පොදුවේ භාවිත වන පර්යේෂණ ක්‍රම මොනවාදැයි පැහැදිලි කර කේවල/සිද්ධි අධ්‍යයන ක්‍රමය වෙත අවධාරණය කරමින් එහි මූලික ලක්ෂණ විස්තර කරන්න.

06. ක්ෂේත්‍ර දත්ත ලබාගැනීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු නිදසුන් සහිතව විස්තර කරන්න.

07. අවශ්‍ය උදාහරණ සපයමින් පර්යේෂණ ආචාර ධර්ම අනුගමනය කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

08. පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.

    i. දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රමයක් ලෙස නිරීක්ෂණයේ ඇති වාසි සහ අවාසි

    ii. දත්ත විශ්ලේෂණය කිරීමේදී සංඛ්‍යාන ක්‍රමවල ඇති වැදගත්කම

    iii. සාහිත්‍ය විමර්ශනය

    iv. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය සකස් කිරීම

*************************